ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

Article 13(1)

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 19th July 2021 |

පැමිණිලි පාර්ශවය : අයි.පී.ඩබ්ලිව්.ආර්. ජයවීර මහතා,
අංක : 31/ඒ, මිල්ලගේ, කිරිදිවැල.

වගඋත්තර පාර්ශවය :

01. ස්ථානාධිපති,
පොලිස් ස්ථානය, කිරිදිවැල.

02. පො.කො. 3997 අමිල සුසන්ත මයා
පොලිස් ස්ථානය, කිරිදිවැල.

03. පො.කො. 26443 එම්.සමන් දයාවංශ මයා,
පොලිස් ස්ථානය, කිරිදිවැල.

04. පො.කො. 83997 ජී.එච්. චානක හේරත් මයා,
පොලිස් ස්ථානය, කිරිදිවැල.

05. පො.කො. 1324 පුෂ්පකුමාර මයා,
පොලිස් ස්ථානය, කිරිදිවැල.

**පැමිණිලි අංක : HRC/1040/15, HRC/2556/16**

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු සිය පැමිණිල්ල මගින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තමා 2015.03.19 වන දින සවස 3.30 ට පමණ තම නිවසට පැමිණෙමින් සිටියදී වගඋත්තරකරුවන් මාර්ගය හරස් කර තම යතුරු පැදිය නතර කර තමාව කිරිදිවැල පොලිස් ස්ථානයට රැගෙන ගොස් 'චානකට

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.com

විරුද්ධව කැලෑ පත්‍ර ගැසුවේදැයි' විමසා පහරදුන් බවත්, පසුව මත්කුඩු ලඟ තබා ගැනීම සම්බන්ධයෙන් බොරු චෝදනා යටතේ පූගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරූ බවත්ය. අධිකරණයේදී නිවැරදිකරු බවට ප්‍රකාශ කළ බවද, පසුව පහරදීම සම්බන්ධයෙන් ගම්පහ රෝහලේ වාට්ටු අංක : 07 හි නේවාසිකව ප්‍රතිකාර ලබාගත් බවද සඳහන් කර ඇත.

පැමිණිලිකරු තම පැමිණිල්ල තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශ මඟින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තමාට පහරදෙන ලද්දේ අමිල සහ පුෂ්පකුමාර යන නිලධාරින් බවයි.

කොමිෂන් සභාව විසින් ගම්පහ රෝහලේ අධිකරණ වෛද්‍යවරයාගෙන් පැමිණිලිකරුට අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාව කැඳවා ඇති අතර, එම වාර්තාවට අනුව බරපතල නොවන තුවාල දෙකක් ඇති බව සඳහන් වේ. එනම්

1. පපුවේ පිටපස වෘත්තාකාර 3 තරම් වූ පිළිස්සුමක්ද,
2. දකුණු විලුඹේ ඉදිමුමක් හා මෘදු වීමක් ඇති බවට දක්වා ඇත. එම තුවාලයන් වින්දිත විසින් අධිකරණ වෛද්‍යවරයාට ලබා දී ඇති රෝගී ඉතිහාසය වන දර පොල්ලකින් පිළිස්සීම සහ පොලුවලින් සිදුකළ පහරදීම යන පහරදීම් ආකාරයන් හා සැසඳේ. එසේම රෝගියාගේ කෙටි ඉතිහාසයේ සඳහන් වන්නේ 'අමිල සහ පුෂ්පකුමාර යන නිලධාරින් පහරදුන් බවයි.'

පැමිණිලිකරු මෙම කරුණ සම්බන්ධයෙන් පොලිස් කොමිෂන් සභාවට හා පොලිස් මූලස්ථානයටද පැමිණිලි කර ඇත.

තවද, පැමිණිලිකරුට විරුද්ධව වගඋත්තරකරුවන් විසින් නඩු අංක : 7496/15 යටතේ පූගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා ඇති නඩුවෙන් පැමිණිලිකරුව නිදොස් කොට නිදහස් කර ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

පළවන වගඋත්තරකාර ස්ථානාධිපති පො.ප. ඩබ්ලිව්.ඒ.ආර්.පෙරේරා මහතා ප්‍රකාශ කර ඇත්තේ, අදාළ දිනයේදී තමා පොලිස් ස්ථානයේ සේවය නොකළ බවත්, එදින තමා නිවාඩු ගොස් සිටි බවත්ය.

දෙවන වගඋත්තරකාර පො.කො. 3997 අමිල සුසන්ත යන අය ප්‍රකාශ කර ඇත්තේ, තමා 2015.03.19 වන දින කිරිදිවැල පොලිසියේ අපරාධ අංශයට අනුයුක්තව සේවය කළ බවත්, එදින පො.සැ. සුනිල්, පො.කො. පුෂ්පකුමාර, පො.කො. දයාවංශ සහ පො.කො. චානක යන නිලධාරීන් සමඟ ලද නියෝග පරිදි වැටලීම් රාජකාරි සඳහා පොලිස් වසමේ සංචාරය කළ බවත්, කණ්ඩායම් භාර නිලධාරියා ලෙස කටයුතු කළ සුනිල් මහතාට ලද තොරතුරක් මත පැය 14.30 ට පමණ කිරිදිවැල නගරයේ පොදු වෙළඳ සංකීර්ණයේ අසල ඇති මස්කඩය අසලදී හෙරොයින් සමඟ පුද්ගලයෙක් අත්අඩංගුවට ගත් බවත්, එදින සටහන් ඇතුළත් කර සැකකරුව පැය 17.15 ට උපසේවයට භාරදුන් බවත්, ඒ සමඟ තම රාජකාරිය අවසන් වූ බවත්ය. පහරදීම සම්බන්ධයෙන් චෝදනා ප්‍රතික්ෂේප කරන බවත්, පො.කො. 83997 චානක නිලධාරියාගේ අවශ්‍යතාවයක් මත මෙම අත්අඩංගුවට ගැනීම සිදුකළා යැයි යන චෝදනාව ප්‍රතික්ෂේප කරන බවත්, ඔහු මෙම පැමිණිලිකරු සමඟ අමනාපයක් තිබූ බව තමා නොදන්නා බවත් ප්‍රකාශ කර ඇත.

තුන්වන වගඋත්තරකාර පො.කො. 26443 මෝරුගමගේ සමන් දයාවංශ යන අය ප්‍රකාශ කර ඇත්තේ, 2019.03.19 වන දින කිරිදිවැල පොලිසියේ කොට්ඨාශ බුද්ධි අංශයට අනුයුක්තව රාජකාරි කළ බවත්, සැරයන් සුනිල්, අමිල, පුෂ්පකුමාර සහ චානක යන නිලධාරීන් සමඟ වැටලීම් රාජකාරි සඳහා සහභාගි වූ බවත්, ඒ අනුව පැය 14.30 ට කිරිදිවැල බස් නැවතුම් පළ ඉදිරිපිට හෙරොයින් ලඟ තබා ගැනීම යටතේ අත්අඩංගුවට ගත් සැකකරුව පොලිසියට භාරදීමෙන් පසුව තමන්ගේ රාජකාරිය අවසන් වූ බවත්ය. පැමිණිලිකරුට කිසිදු අවස්ථාවක පහරදීමක් නොකළ බවත් සඳහන් කරන අතර, එම පහරදීමේ චෝදනාව ප්‍රතික්ෂේප කර ඇත.

හතරවන වගඋත්තරකාර පො.කො. 83997 ඥානරත්න හේරත්ගේ චානක හේරත් යන අය ප්‍රකාශ කර ඇත්තේ, 2019.03.19 දින වනවිට කිරිදිවැල පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ සේවය කළ බවත්, එදින සැරයන් සුනිල් සහ අනෙක් නිලධාරීන් සමඟ වැටලීම් රාජකාරි සිදුකළ බවත්, ඒ අනුව එදින සුනිල් මහතා විසින් හෙරොයින් සමඟ පැමිණිලිකරුව අත්අඩංගුවට ගත් බවත්, පසුව පොලිස් ස්ථානයට ඉදිරිපත් කළ බවත්, කිසිදු අවස්ථාවක පහරදීමක් නොකළ බවත්ය.

පස්වන වගඋත්තරකාර පො.කො. 1324 කංකානම් රාළලාගේ සුමිත් පුෂ්පකුමාර යන අය ප්‍රකාශ කර ඇත්තේ, 2015.03.19 වන දින ඉහත සඳහන් නිලධාරීන් සමඟ වැටලීම් රාජකාරි වලට සහභාගි වූ බවත්, ඒ අනුව හෙරොයින් පැකට් එකක් ලඟ තබා ගැනීම යටතේ පැමිණිලිකරුව සැරයන් සුනිල් මහතා විසින් අත්අඩංගුවට ගත් බවත්, පසුව ස්ථානයට ඉදිරිපත් කර කළඹුබු ගෝල්ඩ් හවුස් නමැති ආයතනයට ගොස් සැරයන් සුනිල් මහතා විසින් එම හෙරොයින් කිරා මැන බැලූ බවත්, කිසිදු අවස්ථාවකදී පැමිණිලිකරුට පහරදීමක් නොකළ බවත්ය.

නිරීක්ෂණ :-

පැමිණිලිකරුට විරුද්ධව පූගොඩ මහේස්ත්‍රාත් අධිකරණය වෙත පවරා තිබූ 7496/15 නඩුවෙන් පැමිණිලිකරුව නිදොස් කොට නිදහස් කර ඇත.

එසේම පැමිණිලිකරුව අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඔහු සතුව හෙරොයින් මි.ග්‍රෑ. 20 ක් තිබූ බවට දක්වා ඇති නමුත් රස පරීක්ෂක වාර්තාවට ඉදිරිපත් කළ පාර්සලයේ දුඹුරු පාට කුඩු මි.ග්‍රෑ. 42 ක් තිබූ බවට සඳහන් කර ඇත.

එසේම කළඹු ගෝල්ඩ් හවුස් ආයතනයෙහි කළමණාකරු ප්‍රකාශ කර ඇත්තේ එහිදී හෙරොයින් කිරා මැන බැලීමක් සිදු නොකළ බවයි.

මේ අනුව මෙම අත්අඩංගුවට ගැනීම මෙම වින්දිත පුද්ගලයා සමඟ තිබූ අමනාපයක් මත සිදුකළ එකක් බවට සැකයක් මතුවන බව නිරීක්ෂණය වේ. අධිකරණයේ නඩු වාර්තාවට අනුවද නිරීක්ෂණය වන්නේ මෙම වැටලීම පුද්ගලික අමනාපයක් මත සිදුකළ එකක් බවයි.

තවද, පොලිස් කොමිෂන් සභාවේ වාර්තාවට අනුව පො.කො. 3997 අමිල නිලධාරියා තොරතුරු සටහන් පොත් වල වැරදි තොරතුරු සටහන් කිරීම යටතේ සහ සැරයන් සුනිල් රාජකාරිය පැහැර හැරීම යටතේ ද චෝදනා ලබා ඇති බව ද නිරීක්ෂණය වේ.

නිගමනය :-

පැමිණිලිකරු දක්වන වධහිංසාවට ලක්කළ ආකාරය, අධිකරණ වෛද්‍ය වාර්තාවේ වූ තුවාල සමඟ සැසඳෙන බව නිරීක්ෂණය වේ. එසේම, අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් තුවාල සමඟ රෝගී ඉතිහාසය සැසඳෙන බව නිරීක්ෂණය වේ.

උක්ත කරුණු අනුව පැමිණිලිකරුව වධහිංසාවට ලක් කිරීමක් සිදුකර ඇති බවට නිගමනය කළ හැක. එමනිසා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 11 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති කෲර හෝ අවමන් සහගත දඬුවමකට නැතහොත් සැලකිල්ලකට ලක් නොකළ යුතුය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම වගඋත්තරකරුවන් විසින් කඩ කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, ඉහත නිරීක්ෂණ වලට අනුව මෙම අත්අඩංගුවට ගැනීම සිදුකර ඇත්තේ පුද්ගලික අමනාපයක් මත බවට කරුණු ඉදිරිපත් වන බැවින් ද, අධිකරණය ඉදිරියේදී වගඋත්තරකරුවන් සාක්ෂි දීමේදි පරස්පර සාක්ෂි ඉදිරිපත් කිරීම මහින්ද පෙනීයන්නේ මෙම අත්අඩංගුවට ගැනීම නීතියෙන් නියම කර ඇති ආකාරයට සිදුකරනු ලැබූ අත්අඩංගුවට ගැනීමක් නොවන බවයි. එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 13(1) වන ව්‍යවස්ථාව මගින් ආරක්ෂා කොට ඇති මූලික අයිතිවාසිකමද උල්ලංඝනය කර ඇති බවටද මානව හිමිකම් කොමිෂන් සභාව නිගමනය කරනු ලබයි.

<u>අමල් සුදත් සිල්වා එරෙහිව කොඩිතුවක්කු</u> නඩුවේද දක්වා ඇත්තේ, කිසියම් තැනැත්තෙකු වධහිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවයි. එසේම, 11 වන ව්‍යවස්ථාව මගින් විධානය කරන්නේ යම් තැනැත්තෙකු විසින් වෙනත් තැනැත්තෙකු වෙත වධහිංසාවක්, කෲර හෝ අමානුෂික සැලකීමක් දැක්වීම තහනම් කරනු ලබන බවයි. එසේම, මෙම අයිතිවාසිකම කිසියම් සීමාවකට හෝ අඩු කිරීමකට යටත් කර නොමැති පරම මූලික අයිතිවාසිකමක් බවයි. අපරාධකරුවෙකු වුවද, එසේ නොවූව ද රටේ සෑම තැනැත්තෙකුටම මෙම අයිතිවාසිකම ඇති බවත්, මෙම අයිතිවාසිකම ආරක්ෂා කිරීමට රජයේ අංශයක් වන පොලිස් බලකායට වුවද කිසියම් අවස්ථාගත කරුණක් යටතේ එම අයිතිවාසිකම ප්‍රතික්ෂේප කිරීම, අඩු කිරීම හෝ සීමා කිරීම නොකළ යුතු බවත්ය.

<u>ඉෂාරා අංජලී එරෙහිව වර්ණ බෝගහවත්ත</u> නඩුවේදී 11 වන ව්‍යවස්ථාව තවදුරටත් තීව්‍ර කර ඇති අතර, අධිකරණයෙන් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරින් විසින් කිසිදු පුද්ගලයෙකු කෲර හෝ අවමන් සහගත සැලකිල්ලකට ලක් නොකළ යුතු බවත්, එසේම නීතිය බලාත්මක කරන නිලධාරින් සෑම අවස්ථාවකදීම සැකකරුවෙකු අත්අඩංගුවට ගත් වහාම අත්අඩංගුවට ගැනීමේ හේතු දැක්විය යුතු අතර, සෑම විටම නීතියට හා මෙම නීතිරීති වලට කීකරු වීමට හා ඒවා පිළිපැදීමට සහතික විය යුතු බවත්ය.

ඒ අනුව පැමිණිල්ලේ ඉදිරිපත් වී ඇති කරුණු වලට අනුව පැමිණිලිකරුට පහරදීම් සිදුකර ඇත්තේ දෙවන වගඋත්තරකාර පො.කො. 3998 අමිල සුසන්ත සහ පස්වන වගඋත්තරකාර පො.කො. 1324 සුනිල් පුෂ්පකුමාර යන අය බවට පැහැදිලිව සඳහන් වන බැවින්, එම අය 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරිම යටතේ අදාළ චෝදනාවට වගකීමට යටත් කළ යුතුය.

**නිර්දේශය :-**

01. ඒ අනුව දෙවන වගඋත්තරකාර පො.කො. 3998 අමිල සුසන්ත සහ පස්වන වගඋත්තරකාර පො.කො. 1324 සුනිල් පුෂ්පකුමාර යන අය විසින් පැමිණිලිකරු වෙත රු. 20,000/-ක මුදලක් වන්දි වශයෙන් ලබාදිය යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

02. වගඋත්තර පාර්ශවීය ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු ඉදිරි පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පති සහ සභාපති ජාතික පොලිස් කොමිෂන් සභාව වෙතද යොමු කරනු ලැබේ.

2021.08. 19 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A Shanmuganathan

අනුසුයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

මා.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

Dr. H.M. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02. සභාපති.
ජාතික පොලිස් කොමිෂන් සභාව,
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 07.

B/